නිවාඩු කාලීන පැවරුම්

සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

6 සතිය 9 පාඩම - ප්‍රායොගික ලේඛන ( ආකෘති පත්‍ර)

1)ආකෘති පත්‍ර පිරවීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු පහත දැක්වේ. එම වැකිවල හිස්තැන් පුරවන්න

(I) ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ නොකිරීම ඒවා ..................වීමට හේතු වේ.
(II) ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට පෙර , දී ඇති .................... හා එහි සඳහන් කරුණු හොඳින් කියවන්න.
(III) ආකෘති පත්‍රවල සඳහන් කළ යුතු සියලු කරුණු ..................... ව දක්වන්න.
(IV) ............................. ප්‍රයෝජනය සඳහා යනුවෙන් ඇති කොටස් සම්පූර්ණ නොකළ යුතු ය.
(V) පරිගණක කාර්යයන්ට අදාළ වන පරිදි සැකසූ ආකෘති පත්‍රවල එක ................. එක අකුරක් හෝ අංකයක් පමණක් යෙදිය යුතු ය.
(කාර්යාලයීය,උපදෙස්,කොටුවක,ප්‍රතික්ෂේප,සංක්ෂිප්ත)

2)ඔබේ පාසලේ ශිෂ්‍යනායක/නායිකා තනතුර සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය ආකෘති පත්‍රයක් සකසා එය ඔබේ තොරතුරුවලින් සම්පූර්ණ කරන්න.

3)ඉහත ඔබ විසින් සැකසූ අයදුම් පත්‍රය ම පරිගණක ක්‍රමයට සකසන්න.

4) පෙළ පොතේ 84 පිටුවේ ඇති බැංකු කටයුතුවල දී ගනුදෙනුකරුවන් විසින් සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

5) 85 වන පුටුවේ දැක්වෙන්නේ ටෙලිමේල් පණිවිඩයක් යැවීම සඳහා අවශ්‍ය ආකෘතියකි. එය පිටපත් කර ගෙන මාතර , වැල්ලමඩමේ පදිංචි ඔබේ මාමට නිවසේ පැවැත්වෙන උත්සවයක් ගැන සඳහන් කරමින් ටෙලිමේල් පණිවිඩයක් ලියන්න

6)ඔබේ පෙළ පොතේ 86 වන පිටුවේ දැක්වෙන්නේ තැපැල් හැඳුනුම් පතක් ලබා ගැනීමේ දී පිරවිය යුතු ආකෘති පත්‍රයයි.එය පිටපත් කරගෙන ඔබේ තොරතුරුවලින් එය සම්පූර්ණ කරන්න

- ස්ටීවන් හෝකින් යනු ආදර්ශමත් චරිතයකි. මෙම මාතෘකාව යටතේ වචන 200ක පමණ රචනයක් ලියන්න.